# පඤ්චමො පාඨො

අථ ඛො සුදින්නස්ස කලන්දකපුත්තස්ස සහායකා යෙන සුදින්නස්ස කලන්දපුත්තස්ස මාතාපිතරො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සුදින්නස්ස කලන්දකපුත්තස්ස මාතාපිතරො එතදවොචුං. “අම්ම, තාත, එසො සුදින්නො අනන්තරහිතාය භූමියා නිපන්නො ‘ඉධෙව මෙ මරණං භවිස්සති පබ්බජ්ජා වා’ති. සචෙ තුම්හෙ සුදින්නං නානුජානිස්සථ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, තත්ථෙව මරණං ආගමිස්සති. සචෙ පන තුම්හෙ සුදින්නං අනුජානිස්සථ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, පබ්බජිතම්පි නං දක්ඛිස්සථ. සචෙ සුදින්නො නාභිරමිස්සති අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, කා තස්ස අඤ්ඤා ගති භවිස්සති? ඉධෙව පච්චාගමිස්සති. අනුජානාථ සුදින්නං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා”ති. “අනුජානාම, තාත, සුදින්නං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා”ති. අථ ඛො සුදින්නස්ස කලන්දකපුත්තස්ස සහායකා යෙන සුදින්නො කලන්දකපුත්තො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සුදින්නං කලන්දකපුත්තං එතදවොචුං. “උට්ඨෙහි සම්ම සුදින්න, අනුඤ්ඤාතො’සි මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා”ති. අථ ඛො සුදින්නො කලන්දකපුත්තො “අනුඤ්ඤාතො’මහි කිර මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා”ති හට්ඨො උදග්ගො පාණිනා ගත්තානි පරිපුඤ්ඡන්තො උට්ඨාසි. අථ ඛො සුදින්නො කලන්දකපුත්තො කතිපාහං බලං ගාහෙත්වා යෙන භගවා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සුදින්නො කලන්දකපුත්තො භගවන්තං එතදවොච. “අනුඤ්ඤාතො’මහි අහං භන්තෙ මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය. පබ්බාජෙතු මං භගවා”ති. අලත්ථ ඛො සුදින්නො කලන්දකපුත්තො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ච පනායස්මා සුදින්නො එවරූපෙ ධුතගුණෙ සමාදාය වත්තති. ආරඤ්ඤිකො හොති, පිණ්ඩපාතිකො, පංසුකූලිකො, සපදානචාරිකො. අඤ්ඤතරං වජ්ජිගාමං උපනිස්සාය විහරති.

( පඨමපාරාජිකං - පාරාජිකපාළි)

**පදමාලාව**

| | | | |
|---|---|---|---|
| **කලන්දකපුත්තස්ස** | (ස) | - | කලන්ද පුත්‍ර වූ |
| **මාතාපිතරො** | (ස) | - | මව්පියෝ |
| **එතදවොචුං** | (සං) | - | මෙය කීවාහු ය |
| **අනන්තරහිතාය** | (ස) | - | කිසිවක් නො ඇතිරූ |
| **භූමියා** | (නා) | - | බිමෙහි |
| **ඉධෙව** | (සං) | - | මෙහි ම |
| **නිපන්නො** | (කි) | - | හොත්තේ (වෙයි) |
| **සචෙ** | (නි) | - | ඉදින් |
| **අනුජානිස්සථ** | (ක්‍රි) | - | අනුදනිවු |
| **දක්ඛිස්සථ** | (ක්‍රි) | - | දක්නාහු ය |

| | | | |
|---|---|---|---|
| **අභිරමිස්සති** | (ක්‍රි) | - | ඇලෙන්නේ ය |
| **පච්චාගමිස්සති** | (ක්‍රි) | - | ආපසු එන්නේ ය |
| **උට්ඨෙහි** | (ක්‍රි) | - | නැගිටින්න |
| **අනුඤ්ඤාතො** | (කි) | - | අනුදන්නා ලදී |
| **හට්ඨො** | (කි) | - | සතුටු වූයේ |
| **උදග්ගො** | (කි) | - | ඔදවැඩි සිත් ඇත්තේ |
| **පාණිනා** | (නා) | - | අතින් |
| **ගත්තානි** | (නා) | - | ගාත්‍රා, ශරීරාංග |
| **පරිපුඤ්ජන්තො** | (කි) | - | පිරිමදින්නේ |
| **උට්ඨාසි** | (ක්‍රි) | - | නැඟී සිටියේ ය |
| **කතිපාහං** | (ස) | - | කීපදවසක් |
| **(බලං) ගාහෙත්වා** | (පූ.ක්‍රි) | - | බලගන්වා |
| **අලත්ථ** | (ක්‍රි) | - | ලැබී ය |
| **අචිරූපසම්පන්නො** | (කි) | - | උපසපන් වී නොබෝ දිනකින් |

**අභ්‍යාස**

1. ''උට්ඨෙහි සම්ම සුදින්න'' යන ඡේදය සිංහලට නගන්න.

2. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කෙ කිං නිස්සාය සුදින්නස්ස පබ්බජ්ජාය අනුජානථාති මාතාපිතරං යාචිංසු?
ii. සචෙ සුදින්නස්ස මාතාපිතරො පබ්බජ්ජං නානුජානෙය්‍යුං තස්ස කිං භවෙය්‍යුං?
iii. පබ්බජ්ජාය අනුඤ්ඤාතභාවං ඤත්වා කො කං උපසඞ්කමි?
iv. චිත්තාපෙක්ඛො හින්නො සුදින්නො කස්මිං නිපන්නො අහොසි?
v. පබ්බජිතො සුදින්නො කීවරූපෙ ධුතගුණෙ සමාදාය වත්තති?

3. ඡේදයෙහි එන වාක්‍ය රටාව අනුගමනය කොට පාලියට නඟන්න.

i. දකුණු දිසාවෙහි මහඇමතිගේ යහළුවෝ ජනාධිපතිතුමා වෙත එළඹ මෙසේ කීවාහු ය.
ii. මේ දරුවා කිසිවක් නො ඇතිරූ බිම වැතිර සිටී.
iii. ඇමතිවරුනි, යැපීම සඳහා වැටුප(වෙතන) අනුමත කරන්න.
iv. යහළුවනි, නැගිටිවු, ඇමතිවරුන් විසින් තොපගේ වැටුප(වෙතන) අනුමත කරන ලදී.
v. ගුරුවරයා යම් තැනක ද අපි සියල්ලෝ ම එතනට යමු.

4. ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

i. බලාපොරොත්තු ඉටුකර ගැනීමට පුද්ගලයකුට තිබිය යුතු සම්පත් මොනවා ද?
ii. මව්පියන් දරුවන් කෙරෙහි දක්වන ආකල්පය කුමක් ද?
iii. පැවිදි වීමට අත්‍යවශ්‍ය වන සාධකය කුමක් ද?
iv. සුදින්නගේ පැවිද්දට අනුමැතිය ගැනීමට යහළුවන් ඉදිරිපත් කළ තර්කය කුමක් ද?
v. පැවිදි වූ තැනැත්තා තුළ තිබිය යුතු උතුම් ගුණාංග මොනවා ද?

## ආඛ්‍යාත භාවිතය II

### හැඳින්වීම

හතරවන පාඩමේ දී ආඛ්‍යාත පිළිබඳ මූලික ලක්‍ෂණ අපි උගත්තෙමු. තව ද වත්තමාන, පඤ්චමී, සත්තමී ආඛ්‍යාත භාවිතය හඳුනාගත්තෙමු. මෙහි දී **හීයත්තනී, අජ්ජතනී, පරොක්ඛා, කාලාතිපත්ති හා භවිස්සන්ති** ආඛ්‍යාත භාවිතය පිළිබඳ ව හදාරමු.

### හීයත්තනී ආඛ්‍යාතය

මෙය අතීතකාල ආඛ්‍යාතයකි. බාලාවතාරයේ "**හීයත්තනී ආ, උං, ඔ, ත්ථ, අ, මහා, ත්ථ, ත්ථුං, සෙ, වහං, ඉං, මහසෙ**" යන සූත්‍රයෙන් එහි ප්‍රත්‍යයමාලාව දක්වේ. පච (පිසීමේ) ධාතුවට හීයත්තනී ප්‍රත්‍යය යෙදී පහත සඳහන් පරිදි පද සිද්ධිය වේ.

| පුරිස | පරස්සපද | | | | අත්තනොපද | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | එකවචන | | බහුවචන | | එකවචන | | බහුවචන | |
| | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය |
| **පඨමපුරිස** | ආ | අපචා | උං | අපචු | ත්ථ | අපචත්ථ | ත්ථුං | අපචත්ථුං |
| **මජ්ඣිමපුරිස** | ඔ | අපචො | ත්ථ | අපචත්ථ | සෙ | අපචසෙ | වහං | අපචවහං |
| **උත්තමපුරිස** | අ | අපච | මහා | අපචමහා | ඉං | අපචිං | මහසෙ | අපචමහසෙ |

හීයත්තනී ආඛ්‍යාතය අතීතකාලය සඳහා යෙදේ. ඊයේ පටන් අතීතය යෙදෙන බව ''**හීයොප්පභුති පච්චක්ඛෙ හීයත්තනී**'' යනුවෙන් සාම්ප්‍රදායික ව්‍යාකරණයේ උගන්වයි. ජාතකපාළියේ හීයත්තනී ක්‍රියා බහුලව යෙදී ඇත. **අජ්ජතනී, හීයත්තනී හා කාලාතිපත්ති** යන විභක්තිවල පද සාධනයේ දී ක්‍රියාපදයේ මුලට 'අ' කාරයක් විකල්පයෙන් ආගම වේ.

උදාහරණ:-

අහං උද්දකං රාමපුත්තං **එතදවොචං.**
පඤ්චාලරට්ඨං අහං **පසාදයිං.**
අගා ජේතවනං ජිනො.
සබ්බාරිවිජයං **අකා.**
භාරද්වාජො බ්‍රාහ්මණො භගවතො සන්තිකෙ පබ්බජ්ජං **අලත්ථ.**
තෙ සහායකා භගවතො සන්තිකෙ පබ්බජ්ජං **අලත්ථුං** උපසම්පදං'ති.

## පරොක්ඛා ආඛ්‍යාතය

ඉන්ද්‍රිය විෂයගත නොවූ අතීත සිද්ධියක් වාර්තා කිරීමේ දී '**පරොක්ඛා**' ආඛ්‍යාතය භාවිත වේ. "**අපච්චක්ඛෙ පරොක්ඛාතීතෙ**" යන බාලාවතාර සූත්‍රයෙන් ඒ බව දැක්වේ. එහි යෙදෙන ප්‍රත්‍යයමාලාව මෙසේ ය. "**පරොක්ඛා ආ, ඌ, එ, ත්ථ, අ, ම්හ, ත්ථ, රෙ, ත්ථො, ව්හො, ඉ, ම්හෙ**" යනු යි. '**පච**' ධාතුව ප්‍රත්‍යය ගැන්වීම පහත සඳහන් පරිදි වේ.

| පුරිස | පරස්සපද | | | | අත්තනොපද | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | එකවචන | | බහුවචන | | එකවචන | | බහුවචන | |
| | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය |
| **පඨමපුරිස** | අ | පපච | උ | පපචු | ත්ථ | පපචිත්ථ | රෙ | පපචිරෙ |
| **මජ්ඣිමපුරිස** | එ | පපචෙ | ත්ථ | පපචිත්ථ | ත්ථො | පපචිත්ථො | ව්හො | පපචිව්හො |
| **උත්තමපුරිස** | අ | පපච | ම්හ | පපචිම්හ | ඉ | පපචි | ම්හෙ | පපචිම්හෙ |

මෙය පාලි භාෂාවේ එතරම් ම භාවිත නොවූ ක්‍රියා රූපයකි. මෙය 'ලු', 'ල' යන ශ්‍රැති සූචනාර්ථය සඳහා භාවිත වේ. ධාතුවේ මුල අකුර ද්විත්ව වීම පද සාධනයේ දී සිදු වේ.

උදාහරණ:-

කුමාරො හීයො ගාමං **ජගාම.**
ගන්තුං සයං අපදතාය **සුසොච** නූනං.
තුම්හෙ පඨමවයෙ සාමණෙරා **බභූවිත්ථ.**

## අජ්ජතනී ආඛ්‍යාතය

පාලි භාෂාවේ භාවිත සාමාන්‍ය අතීත ක්‍රියා විභක්තිය යි. "**සමීපෙජ්ජතනී**" යන බාලාවතාර සූත්‍රයට අනුව සමීප අතීතය අජ්ජතනීයෙන් කියවේ. අජ්ජතනීයෙහි යෙදෙන ප්‍රත්‍යය වන්නේ "**අජ්ජතනී ඊ, උං, ඕ, ත්ථ, ඉං, ම්හා, ආ, ඌ, සෙ, ව්හං, අ, ම්හෙ**" යනුවෙනි. 'ගමු' ධාතුවට අජ්ජතනී ප්‍රත්‍යය යෙදෙන අයුරු පහත දැක්වේ.

| පුරිස | පරස්සපද | | | | අත්තනොපද | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | එකවචන | | බහුවචන | | එකවචන | | බහුවචන | |
| | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය |
| **පඨමපුරිස** | ඊ | අගමි, ගමි අගමී, ගමී | උං | අගමිංසු, ගමිංසු | ආ | අගමා | ඌ | අගමූ |
| **මජ්ඣිමපුරිස** | ඔ | අගමො, ගමො | ත්ථ | අගමිත්ථ, ගමිත්ථ | සෙ | අගමිසෙ | ව්හං | අගමිව්හං |
| **උත්තමපුරිස** | ඉං | අගමිං, ගමිං | ම්හා | අගමිම්හා, ගමිම්හා | අ | අගම | ම්හෙ | අගමිම්හෙ |

අජ්ජතනී ආඛ්‍යාතය බහුල වශයෙන්ම අතීතකාලය සඳහා භාවිත වූ ක්‍රියාපදය යි.

උදාහරණ:-

අඤ්ඤතරා දෙවතා එකමන්තං **අට්ඨාසි**.
බ්‍රාහ්මණා යෙන භගවා **තෙනුපසඞ්කමිංසු**.
බ්‍රහ්මබන්ධු පුරෙ **ආසිං**.
මයං භගවතො සන්තිකෙ පබ්බජ්ජං **අලභිම්හ**.
ආවුසො මා සොචිත්ථ මා **පරිදෙවිත්ථ**.
ත්වං හීයො ගාමං **ගච්ඡො**.

**කාලාතිපත්ති ආඛ්‍යාතය**

"**ක්‍රියාතිපන්නෙතීතෙ කාලාතිපත්ති**" යනුවෙන් බාලාවතාරයේ දැක්වෙන පරිදි සිදු නොවූ අතීත ක්‍රියාව කාලාතිපත්ති නම් වේ. නැතහොත් වැරදී ගිය ක්‍රියාව යි. සිදුවිය හැකිව තිබූ, එහෙත් සිදු නොවූ ක්‍රියාව කාලාතිපත්ති නම් වේ. මෙහි දී '**සචෙ**', '**යදි**' ආදි නිපාත පද යෙදී තිබෙනු දැකිය හැකි ය. එහි ප්‍රත්‍යයෝ වනාහි "**කාලාතිපත්ති ස්සා, ස්සංසු, ස්සෙ, ස්සථ, ස්සං, ස්සම්හෙ, ස්සථ, ස්සිංසු, ස්සසෙ, ස්සව්හෙ, ස්සං, ස්සාම්හසෙ**" යනු යි.

"**සචෙ සො පඨමවයෙ පබ්බජිස්සා අරහා අභවිස්සා.**"
(ඉදින් හෙතෙම පළමු වියෙහි පැවිදි වූවා නම් රහත් වන්නට තිබුණි)

මෙබඳු ක්‍රියා භාවිතයේ දී පුරුෂත්‍රයෙහි පහත ආඛ්‍යාත පද නිපද වේ.

| පුරිස | පරස්සපද | | | | අත්තනොපද | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | එකවචන | | බහුවචන | | එකවචන | | බහුවචන | |
| | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය |
| පඨම පුරිස | ස්සා | අපචිස්සා | ස්සංසු | අපචිස්සංසු | ස්සථ | අපචිස්සථ | ස්සිංසු | අපචිස්සිංසු |
| මජ්ඣිම පුරිස | ස්සෙ | අපචිස්සෙ | ස්සථ | අපචිස්සථ | ස්සසෙ | අපචිස්සසෙ | ස්සව්හෙ | අපචිස්සව්හෙ |
| උත්තම පුරිස | ස්සං | අපචිස්සං | ස්සම්හා | අපචිස්සම්හා | ස්සං | අපචිස්සං | ස්සාමහසෙ | අපචිස්සාමහසෙ |

කාලාතිපත්ති ආඛ්‍යාතය භාවිත වන්නේ ක්‍රියාසිද්ධියේ අභාවය දක්වීමට යි.

උදාහරණ:-

සචෙ සො අගාරං **අජ්ඣාවසිස්සා** චක්කවත්ති රාජා **අභවිස්සා**.
සචාහං පඨමවයෙ අනලසො **අභවිස්සං** සබ්බසිප්පෙසු කොවිදො **අභවිස්සං**.
සචෙ භගවා අඞ්ගුලිමාලස්ස පුරතො න **අගමිස්සා** මහාජානිකරො **අභවිස්සා**.
සචාහං තණ්ඩුලං **අලභිස්සං** ඔදනං **අපචිස්සං**.
සචාහං යානං **අලභිස්සං** ත්වයා සද්ධිං **අගමිස්සං**.

## භවිස්සන්ති ආඛ්‍යාතය

"**අනාගතෙ භවිස්සන්ති**" යන බාලාවතාර සූත්‍රයට අනුව අනාගත කාලය භවිස්සන්ති ආඛ්‍යාතයෙන් යෙදේ. එහි යෙදෙන ප්‍රත්‍යයමාලාව මෙසේ ය. "**භවිස්සන්ති ස්සති, ස්සන්ති, ස්සසි, ස්සථ, ස්සාමි, ස්සාම, ස්සතෙ, ස්සන්තෙ, ස්සසෙ, ස්සව්හෙ, ස්සං ස්සාම්හෙ.**"

'පච' ධාතුවට ප්‍රත්‍යයමාලාව ගැන්වූ විට පහත රූප සෑදේ.

| | පරස්සපද | | | | අත්තනොපද | | | |
|---|---|---|---|---|---|---|---|---|
| පුරිස | එකවචන | | බහුවචන | | එකවචන | | බහුවචන | |
| | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය | ප්‍රත්‍යය | පදය |
| පඨම පුරිස | ස්සති | පචිස්සති | ස්සන්ති | පචිස්සන්ති | ස්සතෙ | පචිස්සතෙ | ස්සන්තෙ | පචිස්සන්තෙ |
| මජ්ඣිම පුරිස | ස්සසි | පචිස්සසි | ස්සථ | පචිස්සථ | ස්සසෙ | පචිස්සසෙ | ස්සව්හෙ | පචිස්සව්හෙ |
| උත්තම පුරිස | ස්සාමි | පචිස්සාමි | ස්සාම | පචිස්සාම | ස්සං | පචිස්සං | ස්සාම්හෙ | පචිස්සාම්හෙ |

මෙම ක්‍රියාරූප අනාගතාර්ථය දීම සඳහා භාවිත වේ. වර්තමාන ප්‍රත්‍යයමාලාවට "ස්ස" කොටස මුලට එකතු කිරීමෙන් මේ ප්‍රත්‍යය ලැබෙන බව වරනැඟීමෙන් ප්‍රකට වේ. උත්තම පුරුෂ අත්තනොපද ඒකවචනය පමණක් වර්තමාන රූපයෙන් වෙනස් වේ.

උදාහරණ:-

කිලන්තොස්මි ආනන්ද නිපජ්ජිස්සාමි.
කිං කරිස්සාමි අරඤ්ඤවාසෙන.
ආයාම ආනන්ද යෙන කුසිනාරා තෙනුපසඞ්කමිස්සාම.
සුපටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

**අභ්‍යාස**

01. පහත ක්‍රියාපදයන්හි ආඛ්‍යාත විභක්තිය, පදය, පුරුෂය, වචනය ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. | උපසඞ්කමිංසු | ii. | අවොචුං |
| iii. | භවිස්සති | iv. | අනුජානිස්සථ |
| v. | අනුජානාම | vi. | උට්ඨෙහි |
| vii. | උට්ඨාසි | viii. | නිසීදි |
| ix. | අවොච | x. | අලත්ථ |

02. පහත සඳහන් ක්‍රියාපද ආඛ්‍යාත විභක්ති හතෙහි (7) පරස්ස පදයෙහි ප්‍රථම පුරුෂයේ වරනඟන්න.

| | පඤ්චමී | සත්තමී | හීයත්තනී | අජ්ජතනී | පරොක්ඛා | කාලාතිපත්ති | භවිස්සන්ති |
|---|---|---|---|---|---|---|---|
| නිදඃ- වන්දති | වන්දතු / වන්දන්තු | වන්දෙය්‍ය / වන්දෙය්‍යුං | අවන්දා/ අවන්දූ | අවන්දි, වන්දි / අවන්දිංසු /වන්දිංසු | වවන්ද වවන්දු | අවන්දිස්සා අවන්දිස්සංසු | වන්දිස්සති වන්දිස්සන්ති |
| චරති<br>කසති<br>නමති<br>සුපති<br>තිට්ඨති<br>ලභති<br>පස්සති<br>හසති<br>නන්දති | | | | | | | |

03. දී ඇති ආඛ්‍යාතපද සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න.

(ආගඤ්ඡුං/පරියාපුණාථ/උපට්ඨහස්සු/නික්කුජ්ජෙය්‍යුං/යන්තු/කරොහි/සමෙමාදිංසු/භාවෙය්‍ය)

i. ඉති ඉමා චතුරාරක්ඛා භික්ඛු .............. සීලවා.
ii. අසෙසා විලයං ............ අනන්තගුණතෙජසා.
iii. ........................ භික්ඛවෙ ආටානාටියං රක්ඛං.
iv. අමනුස්සා රිත්තම්පි පත්තං සීසෙ ................
v. අප්පෙකච්චෙ භගවතා සද්ධිං ........................
vi. ................ තස්සුපට්ඨානං ඛත්තියා බ්‍රාහ්මණා බහු.
vii. ඛීණාසවා අනෙනන පානෙන .......................
viii. යං තෙ කරණීයං තං .......................................

04. හිස්තැන් පුරවන ලද 3 ප්‍රශ්නයෙහි එන වාක්‍ය සිංහලට නඟන්න.

05. පහත ආඛ්‍යාතයන්හි බහුවචන රූපය, ආඛ්‍යාත විභක්තිය, පදය හා පුරුෂය ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. | පක්කමිස්සං | ii. | වසී |
| iii. | ගවෙෂය්‍යං | iv. | අනුජානාහි |
| v. | ඛමස්සු | vi. | වදෙ |
| vii. | අඤ්ඤාසි | viii. | ජගාම |
| ix. | අලභිස්සා | x. | අට්ඨාසි |
| xi. | අද්දසා | | |

06. ඒකවචන රූප ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. | පවත්තයුං | ii. | අබ්‍රවුං |
| iii. | ආහංසු | v. | නිබ්බායිස්සාම |
| v. | පරිදෙවිංසු | vi. | අලත්ථුං |
| vii. | යාචාම | viii. | පමජ්ජන්ති |
| ix. | පරිභවිංසු | x. | කුබ්බන්ති |
| xi. | සමාගච්ඡන්තු | xii. | සමග්ගහුං |
| xiii. | අහු | xiv. | අලභිම්හ |
| xv. | ලභෙය්‍යාම | | |